<u>ඇල්පිටිය ප්‍රාදේශීය සභාව</u>
<u>ගාල්ල දිස්ත්‍රික්කය</u>

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 10 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 22 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංවර්ධන ව්‍යාපෘති 22 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.744,847 ක් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් හා ණයහිමියන් රු.744,847 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ ව්‍යාපෘතියක් වූ අමුගොඩ අතුරු මාර්ගය අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් ඇතිරීමේ කර්මාන්තයෙහි රඳවුම් මුදල් ලෙස ගෙවන ලද රු.49,565 ක් වර්ෂයේ ප්‍රාග්ධන වැය ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය හා ණයහිමියන් රු.49,565 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ කර්මාන්ත සඳහා ගෙවිය යුතු රු.32,148,318 ක් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබිය දී එම කර්මාන්ත සඳහා ගෙවන ලද රු.32,148,318 ක් කර්මාන්ත ණයහිමි ගිණුමට හර කර තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල කර්මාන්ත ණයහිමි ශේෂය රු.32,148,318 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සභාව විසින් රු.1,247,565 ක් වැයකර ඉදිකර තිබූ ඇල්ල ඌරන්වල තලාව ප්‍රදේශයන්ට ප්‍රජා ශාලාව හා රු.770,250 ක් වැයකර ඉදිකර තිබූ ආනන්ද කණිටු විදුහල අසල ළමා උද්‍යානය ද වශයෙන් එකතුව රු.2,017,815 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ දී සභාව විසින් ඇල්පිටිය ළමා ක්‍රීඩාංගනය සඳහා මිලදී ගෙන තිබූ රු.1,444,500 ක ක්‍රීඩා උපකරණ රු.1,083,375 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබීමෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.361,125 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුලදී තෑගි ඔප්පුවකින් සභාවට ලැබී තිබුණු රු.300,000 ක් වටිනාකම වූ අඹගහවත්ත / කනත්තවත්ත නැමති ඉඩම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.12,165,455 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.10,000,000 ක් ලෙස ප්‍රතිපාදන සලසා තිබීමෙන් වර්ෂයේ ආදායම හා ණයගැතියන් රු.2,165,455 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු උසාවි දඩ මුදල රු.2,304,783 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.2,225,000 ක් ලෙස දක්වා තිබීමෙන් වර්ෂයේ ආදායම හා ණයගැතියන් රු.79,783 කින් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.3 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 07 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.33,883,774 ක් වෙනසක් නිරික්ෂණය විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.63,800,268 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා, කාල විශ්ලේෂණය හා තුලනය කරන ලද තැන්පත් ලේඛනය ආදි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,006,487 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,432,236 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 වරිපනම් බදු හා අක්කර බදු

2013 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.6,490,272 ක් වූ අතර හිඟ අක්කර බදු ශේෂය රු.250,892 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2013 දෙසැම්බර් 31 දිනට රු.10,000 ට වැඩි හිඟ වරිපනම් බදු ශේෂයන් පැවති බදුකරුවන් 47 දෙනෙකු විසින් රු.1,194,333 ක් වූ හිඟ බදු ගෙවීම දිගින් දිගටම පැහැර හැර තිබුණි.

(ii) රු.6,490,272 ක හිඟ වරිපනම් බදු හා රු.250,892 ක් වූ හිඟ අක්කර බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 සතිපොල බදු**

---------------

2012 වර්ෂය සඳහා 2014 මාර්තු 30 දින විගණන පරික්ෂණ අවස්ථාව වනවිට අටකොහොට සතිපොලේ හිඟ බදු කුලිය රු.19,166 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු. 2,440,583 ක උසාවි දඩ සහ රු. 9,543,000 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

**2.2.4 කඩ කාමර බදු**

-----------------

සභාවට අයත් පොදු වෙළඳපොලේ සුපිරි වෙළඳ සැලේ හා පදික වෙළඳ සැල් කඩ කාමර බදු දීම සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(i) 2010 දෙසැම්බර් 27 දිනැති අංක: දපපා/පපාකො/2010/01 දරන පළාත් පාලන කොමසාරිස්වරයාගේ චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව සෑම ගිවිසුමක් ම වසර 03 කට වරක් යාවත්කාලීන කළයුතු වුවත්, මෙම කඩ කාමර සියල්ලේම ගිවිසුම් වසර 03 කට වඩා පැරණි ගිවිසුම් බව නිරීක්ෂණය විය.

(ii) ඉහත චක්‍රලේඛයේ 6 වන ඡේදය අනුව යටත් පිරිසෙයින් වසර 05 කට වරක්වත් කඩකුලි සම්බන්ධයෙන් නව තක්සේරුවක් කළ යුතුව තිබුණි. ඒ අනුව මෙම කඩ කාමර සියල්ලේ ම නව තක්සේරු වටිනාකම් 2013 මැයි මාසයේදි සභාවට ලබාගෙන තිබුණ ද විගණන දිනය වන 2014 මාර්තු 25 වන විටත් එම නව තක්සේරු වටිනාකම අනුව බදු මුදල් අය කිරිමට කටයුතු කර නොතිබු හෙයින් රු.1,272,645 ක ආදයමක් සභාවට අයවී තිබුණි.

(iii) ගිවිසුමේ කොන්දේසි පරිදි නියමිත දිනට බදු කුලී ගෙවීම අඛණ්ඩව මාස 03 පැහැර හරින විට හිඟ කුලී අය කරගෙන, ඒ හේතුව මතම බදු ගැණුම්කරු නෙරපා දැමීමට ප්‍රාදේශීය සභාවට බලය තිබුණ ද, කඩ කාමර 23 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

සභාවේ සේවය කරන ලද මාරු වී ගිය, විශ්‍රාම ගිය සහ සේවය අතහැර ගිය සේවකයින් 07 දෙනෙකුගෙන් අයකර ගතයුතු රු.33,534 ක් වර්ෂ 01 සිට 06 දක්වා කාලයක් හිඟහිට තිබුණි.

**3.2 නිශ්ක්‍රීය වත්කම්**

-------------------

2013 ජුනි 05 දිනැති අංක: PC/MD/FR/2013 දරන ජනාධිපති ලේකම් චක්‍රලේඛය පරිදි රජයේ ආයතන තුළ ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ 2013 සැප්තැම්බර් 05 දින වනවිට අපහරණය කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙසට දන්වා තිබුණි. සභාවට අයත් කැබ් රථයක් හා බවුසරයක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට දිරාපත් වෙමින් සභා පරිශ්‍රයේ රඳවා තිබෙන බව 2014 මාර්තු 24 දින සිදු කරන ලද විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

**4. පද්ධති හා පාලන**

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය